# අපූරු යාළුවෝ



කථාව : ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

# හැඳින්වීම

කෘතියේ නම: අපූරු යාළුවෝ

කතෘගේ නම: ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘ අයිතිය : (කථාව සහ සිතුවම්)

ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘගේ වෙනත් කෘති : පුංචි රුවනි,අවුරුදු කුමාරයා

ආඩම්බර හා පැංචා

කෘතිය පළ කල දිනය : 2025.02.08

**ISBN අංකය: 978-624-208-413-8**

# පිදුම

මෙම කථාපොත ලිවීමට මා හට උපකාර කල මාගේ අම්මාටත් පවුලේ සියළු දෙනා හා මාගේ ගුරු මව්වරුන්ටත් ආදරයෙන් මෙම පොත පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය.

මාහට අකුරු කියාදුන් මාගේ ආදරණීය ගුරුතුමියන් වන රේනුකා ගුරුතුමියටත් මදාරා ගුරු හා මෙම අවස්ථාව මා හට ලබාදුන් මාගේ පාසලේ විදුහල්පතිතුමියට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

ඔන්න එකමත් එක් කැලයක  වදුරු පැංච කෙනෙක් හිටියා. එයාගේ හොදම යාලුවා තමයි අලි පැංචා මේ දෙන්න හොදම යාලුවෝ.



මේ දෙන්නා සෙල්ලම් කලේ කැවේ බිව්වේ එකටමයි.

මෙයාලා දෙන්නා හරිම හොඳ යාලුවෝ.

ඒ දෙන්නා කවදාවත් රන්ඩු වුනේ නෑ.කැලේ හිටිය

අනිත් සත්තු හැමෝම මේ දෙන්නාගේ හොඳම යාලුවෝ.



අලියා ගොඩාක් උසයි. ඒ නිසා එයාට කැලේ හැම තැනම පේනවා.වඳුරු පැංචා පොඩියි.

.




ඒත් එයා උස ගස් වලට නගිනවා.

මේ දෙන්නා හැමදාම කැලේ සෙල්ලම් කරනවා.



වඳුරු පැංචා ගස්වල ගෙඩි කඩලා අලි පැංචට දෙනවා.අලි පැංචත් වඳුරු පැංචට පළතුරු කෑම ජාති ගෙනත් දෙනවා.



එක දවසක් වඳුරු පැංචා අලි පැංචට පළතුරු හොයන්න කැලේ ඈතට ගියා. වඳුරු පැංචා අඹ ගෙඩි ගොඩාක් අරන් අලි පැංචා හොයන්න පටන් ගත්තා.



“ගර්......ගර්......”පඳුරු අස්සෙන් භයානක සද්දයක් ඇහුණා. වඳුරු පැංචා හොඳටම බය වුනා.එයා හයියෙන් කෑගැහුවා.එක පාරටම කොටිරාළ එළියට ආවා.පැනපු ගමන් වඳුරු පැංචා පස්සේ පන්නන්න පටන් ගත්තා.



වඳුරු පැංචා පුළුවන් හයියෙන් දුවන්න පටන් ගත්තා.කොටි රාළ ළඟ ළඟම එන නිසා ගහකටවත් නගින්න වඳුරු හාමිට බැරි වුණා.



වඳුරු පැංචගේ කකුල ගලක පැටලුනා.කොටි රාළ පැංචගේ ඇඟට පැන්නා.....එතකොටම වේගයෙන් එතනට ආපු අලි පැංචා හොඬවැලෙන් අල්ලලා කොටි රාළව ඈතට වීසි කළා.



කලබල වුණ කොටි රාළ පණ කඩාගෙන

දිව්වා.“කොහොමද යාළුවේ ඔයා හොදින් නේද?” අලි

පැංචා වඳුරු පැංචගෙන් ඇහුවා.....බය වෙලා හිටපු වඳුරු

පැංචා අලි පැංචගේ පිට උඩට නැග්ගා.



“ඔයා තමයි මගේ ජීවිතේ බේරුවේ යාලුවේ” කියලා වඳුරු පැංචා කිව්වා.ඉතින් මේ දෙන්නා අයෙමත් හොඳ යාළුවෝ වගේ කාලය ගත කරා.

“අපිට ඉන්න හොද යාළුවෝ හැමදාම කරදරයකදී අපිට උදවු කරනවා.ඒක නිසා යාළුවන්ට පුළුවන් හැම වෙලේම උදවු කරන්න ඕනි.”

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්